www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

**විරැක්ෂා රේට්ටුව ඉහල නැගෙද්දී වෝල් වීදියේ කොටස් මිල ඉහලට**
Wall Street rallies as unemployment rate soars

# අප්‍රේල් මාසය තුල එක්සත් ජනපදය රැකියා ලක්ෂ පහක් අහෝසි කරයි

## US shed another half-million jobs in April

**අන්ද්‍රේ ඩැමොන් විසිනි**

**2009 මැයි 09**

කම්කරු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද සංඛ්‍යා ලේඛනවලට අනුව පසුගිය මාසයෙහි එක්සත් ජනපද නිල විරැකියා අනුපාතිකය සියයට 0.4ක ප්‍රතිශතයකින් වර්ධනය වෙමින් සේවා වියුක්තිය සියයට 8.9 ක් දක්වා ඉහල නැගුනි. 207 දෙසැම්බරයේ ආර්ථික පසුබෑම ඇරඹීමෙන් අහිමි වූ රැකියා ප්‍රමානය මිලියන 5.7ක් දක්වා ඉහලයත්ම අප්‍රේල් මාසය තුල ආර්ථිකයට රැකියා පන්ලක්ෂ තිස් නවදාහක් (539,000) අහිමි විය.

මෙයට අමතරව පෙබරවාරි සහ මාර්තු මාස වෙනුවෙන් තමන් කලින් එස්තමේන්තු කල ප්‍රමානයට වඩා රැකියා 66,000ක් අහෝසි වී ගිය බව කම්කරු දෙපාර්තමේන්තුව නිවේදනය කලේ ය.

නිල විරැකියා අනුපාතිකය ඉහල නගිමින් නිවේදනය කරන ලද පරිදි තවත් ලක්ෂ පහක රැකියා අහිමි වුවද පසුගිය සිකුරාදා වෝල් වීදියේ කොටස් වෙලඳ පොලෙහි මිල ගනන් කැපීපෙනෙන අයුරකින් ඉහල නැංගේ ය. ඩව් ජෝන්ස් කාර්මික සාමාන්‍යය ඒකක 164.8කින් වැඩි වෙමින් දිනය අවසානයේ සියයට 1.9ක වැඩි වීමක් වාර්තා කලේ ය. නස්ඩැක් සංයුක්ත දර්ශකය ඒකක 22.8කින් ඉහල නැංගේ ය. මෙය සියයට 1.33ක වර්ධනයකි. වඩාත් පුලුල්වූ ස්ටැන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්හි 500 දර්ශකය ඒකක 21.8කින් නොහොත් සියයට 2.41ක අනුපාතයකින් වඩාත් කැපීපෙනෙන ලෙසට ඉහල නැංගේ ය.

තවත් අඳුරු රැකියා වාර්තාවක් ඉදිරියේ ඩව්ජෝන්ස් සාමාන්‍යය ඒකක 8,600කට සමීපවීමත් සමග මූල්‍ය වෙලඳපොලවල් දෙමසක් පුරා එක දිගට ඉහල යාමෙන් අවධාරනය කරනුයේ ඇමරිකාවෙහි පන්ති විභේදනය හා ඔබාමාගේ ප්‍රතිපත්ති පිලිබඳ තත්වයයි.

දසලක්ෂ ගනන් ජනතාවට තම නිවාස කුලී ද උකස්කර ගෙවීම් ද නයවර පත්වල නය ද කෙසේවත් ගෙවා ගැනීමට නොහැකිව තිබිය දී මූල්‍ය වෙලඳපොලවල් ඉහල නගිමින් තිබේ. උකස් බේරාගැනීම පිලිබඳ තොරතුරු සොයන ආයතනයක් වක රියැලිට්ට්‍රැක්-ඩොට්කොම් සමාගමට අනුව, අප්‍රේල් මාසයේ පමනක් නිවාස උකස් බේරා ගැනීම වලක්වන ක්‍රියාන්විතයන් 150,000කට ආසන්න ප්‍රමානයක් දියත් කර ඇත. තවද, නයවර පත්වලට අදාල ගෙවීම් පැහැර හැරීම් වාර්තාගත මට්ටමකට ඉහල ගොස් ඇත.

පාලන තන්ත්‍රය විසින් පවත්වන ලද බැංකු විසින් පීඩනය දරා ගැනීම පිලිබඳ පරීක්ෂනවල බ්‍රහස්පතින්දා නිකුත් කරන ලද ප්‍රතිපල ගැන සෑහීමකට පත්වීම තුලින් සිකුරාදා වෝල්වීදියේ නැග්ම යම්තාක් දුරකට අවුලුවන ලදී. පාලන තන්ත්‍රය, විශාලතම බැංකු මුහුන දුන් මූල්‍යමය අර්බුදය අවතක්සේරු කලේ ය. එය එසේ කලේ බිඳ වැටෙන බැංකු ගොඩනැගීමට සහනයක් ලෙස බදු ගෙවන්නන්ගේ අරමුදල් යෙදවීම තව දුරටත් ගෙනයමින් බැංකු අධීක්ෂනය කිරීම අවම කිරීමට ඇති සිය අභිප්‍රාය පැහැදිලි කරන අතරවාරයෙහි ය.

මහා අවපාතයෙන් පසුව ගැඹුරුතම පසුබෑමට ගොදුරු වී සිටින දශ ලක්ෂ සංඛ්‍යාත කම්කරුවන් වෙනුවෙන් ආන්ඩුව කිසිදු වැදගත් පියවරක් යෝජනා නොකරයි. ඒ අතරවාරයේම ප්‍රධාන බැංකුවලට මුක්කු ගසා ඔසවා තැබීම වෙනුවෙන් ''අවශ්‍ය ඕනෑම පියවරක් ගැනීමට'' සූදානම්ව සිටියි.

ඇත්ත වශයෙන් ම, ඔබාමා පාලන තන්ත්‍රය, ජෙනරල් මෝටර්ස් හා ක්‍රයිස්ලර් සමාගම්වල කම්කරුවන් වෙත එල්ල කරන ලද ප්‍රහාරය තුලින් සංගත ලාභ වෙනුවෙන් කර්මාන්තවල පරිමානය තව දුරටත් සීමා කිරීමට හා ඇමරිකානු ආර්ථිකය ප්‍රතිව්‍යුහගත කිරීමට අනුබල දීම සඳහා අර්බුදය සිය වාසියට උපයෝගී කර ගනිමින් සිටී. ආන්ඩුව හා මාධ්‍ය විසින් උනුසුම් ලෙස පිලිගනු ලබන ඊනියා ''පුනරාගමනය'' මූල්‍ය ප්‍රභූව විසින් කෙරෙන ධනය

එක්රැස් කිරීමෙහි ප්‍රතිප්‍රාප්තියක් වීම පිලිබඳ සියලු ඇඟවීම් පවතියි. එය පදනම් වනුයේ දිග් ගැස්සුන පරිහානියක් හා කම්කරු පන්ති වැටුප් හා ජීවන තත්වයන් පහත දැමීමක් මතය.

වැටුප් ලේඛනවල පහත වැටීම හයමාසයක් තුල අඩුම මට්ටම විය. ඒ සෑම මසකම රැකියා අහිමිවීම් 600,00කට අධික විය. වෙනසෙහි වැඩි ප්‍රමානයකට හේතු වූයේ සෘතුමය ගැලපුම්වලින් ගනනය නොකල ආන්ඩුව විසින් ගත් කාලානුරූප පියවරයන් ය. 2010 සංගනනයට සූදානම්වීමක් වශයෙන් වොෂිංටනය තාවකාලික වැඩ කරන්නන් 60,000ක් බඳවාගැනීමත් සමග පසුගිය මාසයේ ආන්ඩුවේ වැටුප් ලේඛන 70,000කින් වැඩි විය.

හයිෆ්‍රීකුවන්සි ඉකොනොමික්ස් ආයතනයේ ප්‍රධාන අර්ථශාස්ත්‍රඥ ඉයන් ෂෙපඩ්සන් පෙන්වා දුන් පරිදි ''මෙය පෙබරවාරි හා මාර්තු මාසවල සාමාන්‍යය වූ 690,000 තරම් ම කනස්සල්ල දනවන්නේ නැත. එනමුදු, එය කිසිම අන්දමකින් ජයග්‍රහනයක්හෝ ස්ථායීකරනය තහවුරුකිරීමක් නොවේ''. නිල සේවා වියුක්ති අනුපාතිකය සියට 0.4කින් වැඩි වීම පසුගිය හත්මසක ප්‍රවනතාව සහ ගැලපෙන අතර රැකියා අහිමිවීම් අනුපාතිකය අඩුවන බවට කෙරෙන ප්‍රකාශවලට පරස්පර වේ.

රැකියා විනාශය තව දුරටත් පද්ධතිගතව පවතී. අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා හා රාජ්‍ය අංශයේ හැරුනු විට ආර්ථිකයෙහි අන් සියලු අංශවල අප්‍රේල් මස තුල රැකියා අහිමිවුනි.

නිෂ්පාදන අංශය තව දුරටත් හැකිලෙමින් රැකියා 149,000ක පිරිහීමක් වාර්තා කලේ ය. අහිතකර ම බලපෑම් ඇතිවූයේ ප්‍රවාහන උපකරන, පෙර සැකසුම් ලෝහ නිමැවුම් හා යන්ත්‍රසූත්‍ර කර්මාන්තවලට ය. සැප්තැම්බර් මාසයෙන් අනතුරුව නිෂ්පාදන අංශයේ අහිමි වූ රැකියාවල සමස්තය 12 ලක්ෂයකි. මාර්තු මස අලෙවි කල වාහන සංඛ්‍යාව වූ ලක්ෂ 99 අප්‍රේල් මස ලක්ෂ 93 දක්වා පහත වැටෙත්ම මෝටර් රථ කර්මාන්තයෙහි තවත් රැකියා 100ක් විනාශ විය.

සිල්ලර වෙලඳම, සෞඛ්‍ය පහසුකම්, අධ්‍යාපනය, විවේකකාල සේවා ආගන්තුක සත්කාර සේවා ව්‍යාපාරික සේවා හා රාජ්‍ය අංශ ඇතුලු සමස්ත සේවා කර්මාන්තය ම රැකියා 269,000ක් අහෝසි කලේ ය. සිල්ලර වෙලඳම් වැටුප් ලේඛනවල අඩුවීම 46,700කි. ඉදිකිරීම් අංශයෙහි වැටුප් ලේඛන 110,000කින් පහත වැටුනි. මූල්‍යමය සමාගම්වල රැකියා 135,000ක් අහමි විය.

ප්‍රධාන සේවා, අත්හිටුවීම් නිවේදන තව දුරටත් දෛනිකව නිකුත් කෙරේ. රසායනික ද්‍රව්‍ය නිෂ්පාදක ඩූ පොන්ට් සමාගම, වැඩිපුර රැකියා 200ක් කපා හැරීමට සැලසුම් කරන බවට මේ සතියේ නිවේදනය කලේ ය. තවද, කලින් නිවේදනය කල සේවා අත්හිටුවීම් 5000ට අමතරව 2000ක් සේවයෙන් පහකල හැකි බවට මයික්‍රොසොෆ්ට් සමාගම නිවේදනය කලේ ය.

පැයකට ඉපයීම් සාමාන්‍යය පසුගිය මස වැඩි වූයේ යන්තමින් ඩොලර් ශතයකින් බව කම්කරු දෙපාර්තමේන්තුව වාර්තා කලේ ය. මෙය 2004 දෙසැම්බරයෙන් අනතුරුව වාර්තාවූ අඩුම මට්ටම පසුබෑම ආරම්භවූ කාල පරිච්ඡෙදය පුරා ස්ථාවරව පැවති වැටුප් වර්ධක අනුපාතිකය, මේ වර්ෂය මුල සිට කැපීපෙනෙන ලෙස අඩු වී ඇත. 2008 වර්ෂයේ දී සියයට 0.69කින් මාසික වැටුප් වර්ධන අනුපාතිකයේ සාමාන්‍යය වැඩි විය. එනමුදු, 2009 වසරේ මුල් මාස කිහිපය තුල වැටුප් වර්ධන අනුපාතිකය සියයට 0.26කින් පහත වැටී ඇත.

පහත වැටෙන වැටුප් වර්ධන අනුපාතිකය, මහා ව්‍යාපාර මගින් වැටුප් කපාහැරීමේ වර්ධනය වන මෙහෙයුමක් පිලිබිඹු කරයි. ආර්ථිකයෙහි බොහෝ අංශවලට අදාල වැටුප් හා සහන කපා හැරීම පිලිගැනීමට කම්කරුවන්ට බලපෑම් කිරීම සඳහා ඉහල මට්ටමක ඇති විරැකියා අනුපාතිකය මහා ව්‍යාපාර විසින් සිය වාසියට යොදා ගනී.

2007 දෙසැම්බරයේ පසුබෑම ඇරඹීමෙන් අනතුරුව දිගු කාලීන විරැකියාව තෙගුනයකට ආසන්න ප්‍රමානයකින් වැඩි වී ඇත. සති 27ක් හෝ ඊට අධික කාලයක් තුල විරැකියාවෙන් පෙලෙන සංඛ්‍යාව පසුගිය මාසයේ ලක්ෂ 37ක් දක්වා වැඩි විය. අප්‍රේල් මාසය තුල පමනක් මෙය 498,000කින් ඉහල නැගුනි.

මහා අවපාතයෙන් අනතුරුව ඇතිවූ පසුබෑමේ කිසිදු අවධියකට වඩා වර්තමාන තත්වය තුල එක්සත් ජනපදයේ රැකියා අහෝසි වී ගියේ ය. පසුගිය වසර තුල පමනක් සේවා වියුක්ති සංඛ්‍යාව ලක්ෂ 60 කින් වැඩි වී ඇත. මේ අතර, සේවා වියුක්ති අනුපාතිකය සියයට 3.9ක ප්‍රතිශතයකින් වැඩි වී ඇත.

නිල සේවා වියුක්ති අනුපාතිකය ගනනය කරනුයේ පසුගිය සති කිහිපය තුල රැකියා සොයා ගිය අය පදනම් කරගෙන පමනක් නිසා එම අනුපාතිකය සේවා වියුක්තියෙහි සැබෑ පරිමානය සැලකිය යුතු ප්‍රමානයකින් අවතක්සේරු කරයි. වැඩ කිරීමට කැමති නමුදු මෑතක දී රැකියා සොයා නොගිය පිරිස් ද ගනනය කරනුයේ නම්, මේ අනුපාතිකය සියයට 10.1 දක්වා ඉහල නගී.

තමන්ට පූර්නකාලීන රැකියා සොයාගැනීමට නොහැකි වීම නිසා අර්ධකාලීන රැකියාවල යෙදී සිටින අයගේ සංඛ්‍යාව, ආර්ථිකය පිරිහීමට නැඹුරු වීමේ හේතුවෙන් බොහෝ සෙයින් වර්ධනය වී ඇත. වසරකට කලින් මේ කොටස සේවා නියුක්ති සංඛ්‍යාවෙන් සියයට 3.3ක් පමනක් වූ අතර අප්‍රේල් මාසයේ දී එය සියයට 5.7ක් විය.

කම්කරු දෙපාර්තමේන්තුවට අනුව ''අධෛර්යමත් වූ'', ''ආන්තිකව අනුයුක්තවූ'' හා ස්වෙච්ඡා නොවන අර්ධකාලීන කම්කරුවන් ඇතුලු කල හොත් විරැකියා අනුපාතිකය සියයට 15.8ක විශ්මය ජනක ප්‍රතිශතයක් වෙයි. මෙය පසුගිය වසරේ ප්‍රතිශතය වූ සියයට 8.9 සිට විශාල නැග්මකි. මෙහි අරුත වනුයේ සෑම කම්කරුවන් 7 දෙනෙකුට ම එක් අයෙක් දුප්පත් මට්ටමේ හෝ ඊට ආසන්න ආදායම් මත යැපෙන සේවා වියුක්තිකයන් හෝ ඌන සේවා වියුක්තිකයන් වීමයි. දුප්පත් මට්ටමේ ආදායම් ලබන දස ලක්ෂ ගනන් පූර්නකාලීන කම්කරු සංඛ්‍යාව මෙයට එකතු කල හොත් කම්කරු පන්තිය මුහුන දෙන සමාජ ව්‍යසනය පිලිබඳ හැඟීමක් කෙනෙකුට ඇතිවනු ඇත.

සේවා වියුක්ති අනුපාතිකයෙහි නැග්ම ආන්ඩුව විසින් පල කරන ලද අනාවැකිවලට වඩා වේගවත්ව වැඩිවී ඇත. 8.9ක් වන වර්තමාන සේවා වියුක්ති අනුපාතිකය, ආන්ඩුව විසින් කරන ලද බැංකු ආතතීන් දරාගැනීම් පිලිබඳ පරීක්ෂනවලින් 2009 වසර වෙනුවෙන් පෙනෙන්නට සැලැස්වූ ''අයහපත් ම තත්වයේ දසුන'' හා දැනටමත් සමාන වේ. සේවා වියුක්තිය වර්තමාන අනුපාතිකය අනුව වර්ධනය වේ නම් එය සියයට 10.4ක ප්‍රතිශතයක් දක්වා ඉහල නගිනු ඇත. මෙය තෙමසක් ඇතුලත 2010 වසර නරකම ගනන්බැලීම් පවා ඉක්මවා යයි.

© www.wsws.org